# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
# බස්නාහිර පළාත

மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் அலுவலகம்
மேல் மாகாணம்

## OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
## WESTERN PROVINCE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } WP/PD/ES/3/PHLT/AT/2025 | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 2026.08.13 |

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කොළඹ/ ගම්පහ/ කළුතර.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2026 සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම.</u>**

බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් එම ශිල්පීන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධ සමාලෝචන කමිටු තීරණ ඇමුණුම මඟින් ඔබ වෙත යොමු කරමි. මෙමගින් කරන ලද සංශෝධනයන්ට යටත්ව මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2026.06.25 දිනැති ලිපිය මඟින් යෝජිත 2026 වර්ෂයට අදාළ ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

- **ස්ථාන මාරු සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධාරීන්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 239 හා 263 වගන්තිවල විධිවිධානවලට අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.**
- **ඉදිරිපත් කරනු ලබන අභියාචනයන් සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ දින සිට රාජකාරි දින 14ක් ඇතුළත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.**

02. ඒ අනුව, 2026 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම්වලට යටත්ව, ඔවුන්ගේ අනුප්‍රාප්තිකයා පැමිණෙන තුරු නොසිට වාර්ෂික ස්ථාන මාරු **<u>2026.10.01 දින සිට ක්‍රියාත්මක සේ සලකා</u>** වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන් තම ආයතනයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි මුදා හැරිය යුතු අතර, නියමිත රාජකාරී ආවරණය කිරීමට තාවකාලික වැඩපිළිවෙලක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට ආයතන ප්‍රධානියා විසින් ක්‍රියා කළ යුතු බව දන්වමි.

03. එසේම, මෙම ස්ථාන මාරු ලැයිස්තුව බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ <u>https://healthdept.wp.gov.lk</u> දරණ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකි බව ද වැඩි දුරටත් දන්වමි.

විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (රා.ආ.),
බස්නාහිර පළාත.

පිටපත් :
1. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.) - කා.දැ.ගැ.පි.
2. අංශ ප්‍රධාන, තොරතුරු තාක්ෂණ අංශය - ප.සෞ.සේ.අ.කාර්යාලය (බ.ප.)- වෙබ් අඩවියේ පළ කිරීම සඳහා
3. ලේකම් - සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පීන්ගේ සංගමය - කා.දැ.ගැ.පි.


| | කාර්යාලය / அலுவலகம் / Office | පළාත් අධ්‍යක්ෂ / மாகாண பணிப்பாளர் / Provincial Director | සැලසුම් අංශය / திட்டக் கூறு / Planning Unit | නි.අධ්‍යක්ෂ (පාලන) / பிரதி பணிப்பாளர் (நிர்வாகம்) / Deputy Director (Admin) | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Adm. Officer |
|---|---|---|---|---|---|---|
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk |

ශාන්ති මාවත,කොස්වත්ත,තලංගම,බත්තරමුල්ල. சாந்தி மாவத்தை, கொஸ்வத்தை, தலங்கம, பத்தரமுல்ல. Shanthi Mawatha,Koswatta,Thalangama,Battaramulla

www.healthdept.wp.gov.lk

| මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලොචන කමිටුව 2026 | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසය - ගම්පහ | | | | | |
| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු නියෝගය | අනුප්‍රාප්තිකයාගේ නම | සමාලොචන කමිටු තීරණය |
| 1 | එස්.කේ.අයි.එස්. සේනාධීර මිය | බරවා රෝග මර්ධන ඒකකය - ගම්පහ | දිස්ත්‍රික් මහ රෝහල - ගම්පහ | කේ.ඒ.එන්.ඩී.කුමාරි මිය | අභියාචනයේ සඳහන් කරුණු සලකා බලා අභියාචනය ප්‍රතික්ෂේප කෙරේ. ස්ථාමාරුව ක්‍රියාත්මකයි. |
| 2 | ඒ.ඩබ්.ඒ.සී.ඩී. අබේසේකර මිය | කිරිබත්ගොඩ මුලික - රෝහල | බරවා රෝග මර්දන ඒකකය - ගම්පහ | එන්.කේ. හෙන්දාවිතාරණ මිය | අභියාචනයේ සඳහන් කරුණු සලකා බලා වෛද්‍ය හේතුන්මත ස්ථාමාරුව අවලංගු කෙරේ. |

- ඒ.ඩබ්.ඒ.සී.ඩී. අබේසේකර මියගේ ස්ථානමාරුව අවලංගු වීමෙන් අක්‍රීය වන එන්.කේ. හෙන්දාවිතාරන මහත්මියගේ ස්ථානමාරුව අනුප්‍රාප්තිකයකු ලද පසු ක්‍රියාත්මක වේ.

විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක
එම්.බී.බී.එස්.එම්.ඒ.එම්.එස්.සී.,එම්ඩී
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (රා.ආ)
බස්නාහිර පළාත